දිනන දකුණ

දක්ෂිණාංශික දේශපාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ සාමූහිකය.

මාධ්‍ය නිවේදනය.
2026-11-29

ආර්ථිකය ස්ථාවර කිරීමේදී වැඩ කරන ජනතාවගේ මානව සුරක්ෂිතභාවයට ප්‍රමුඛත්වය ලබා දෙන්න!

රාජ්‍ය අංශයේ වැඩවර්ජන ඉල්ලීම් සඳහා විසඳුම් ලබා දෙන්න!

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති විසින් දියත් කිරීමට නියමිත මහා වැඩවර්ජනය සඳහා දිනන දකුණ සාමූහිකය සිය පූර්ණ සහයෝගය සහ සහෝදරත්වය පළ කර සිටී.

වැඩ කරන ජනතාව විසින් නොවැම්බර් 30 වැනිදා ආරම්භ කිරීමට නියමිත මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය, මේ රටේ ජනතාවගේ මානව සුරක්ෂිතභාවය බරපතළ අර්බුදයකට ඇද වැටීම පිළිබඳ ඛේදවාචකයේ අවසාන අනතුරු ඇඟවීමක් ලෙස අපි දකිමු.

එම තීරණාත්මක ක්‍රියාමාර්ගය රජය අර්ථ දක්වන පරිදි හුදෙකලා කඩාකප්පල්කාරී ක්‍රියාවක් නොව, මිලියන සංඛ්‍යාත පුරවැසියන් අන්ත අසරණභාවයට ඇද දමා ඇති දරාගත නොහැකි ජීවන වියදම් අර්බුදයට එරෙහිව පැන නැඟුණු සාධාරණ මෙන්ම නොවැළැක්විය හැකි ප්‍රතිචාරයකි.

ප්‍රාථමික ගිණුමේ ශේෂය පවත්වා ගැනීම සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 16%ක රාජ්‍ය ආදායම් ඉලක්කය කරා ළඟා වීම වැනි සාර්ව ආර්ථික දර්ශක පෙන්වා දෙමින් වත්මන් පාලනය ආර්ථික ප්‍රකෘතියක් පිළිබඳ උදම් ඇනුවද, එම සංඛ්‍යාලේඛන පිටුපස දිනෙන් දින උග්‍ර වන සමාජ අර්බුදයක් පවතී.

මානව සුරක්ෂිතභාවයෙන් තොර පරිසරයක් තුළ සැබෑ ආර්ථික ස්ථාවරත්වයක් පැවතිය නොහැකි බව අප සාමූහිකය අවධාරණය කර සිටී.

දරිද්‍රතාව ඉහළ නංවන අසාධාරණ බදු බර

ශ්‍රී ලාංකික පවුල් පීඩාවට පත් කරන අසාධාරණ බදු බර සහ ජීවන වියදම් ඉහළ යාම වත්මන් ආර්ථික අර්බුදයේ බරපතළ පැතිකඩක් බවට පත්ව තිබේ.

එයට මූලික පදනම සපයා ඇත්තේ වර්තමාන රජය විසින් පවත්වාගෙන යනු ලබන අසාධාරණ සහ අසමතුලිත රාජ්‍ය මූල්‍ය ව්‍යුහයයි.

වක්‍ර බදු සහ ඍජු බදු අතර 80:20ක අනුපාතයක් මත රජය යැපීම හේතුවෙන් ආදායම් මට්ටම පිළිබඳ වෙනසකින් තොරව පහළ සහ මධ්‍යම ආදායම්ලාභීන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටිති.

එහි ප්‍රතිඵලයක් ලෙස එදිනෙදා පරිභෝජනය හරහා රාජ්‍ය ආදායම් රැස් කිරීමේ බර වැඩ කරන ජනතාවගේ පවුල් මත පැටවී තිබේ.

නිරපේක්ෂ දරිද්‍රතාව මෙන්ම සාපේක්ෂ දරිද්‍රතාව ද බියජනක මට්ටමකට ඉහළ ගොස් ඇති අතර, මේ වන විට ජනගහනයෙන් 80%ක් පමණ සාපේක්ෂ දරිද්‍රතාවයෙන් පෙළෙන බවට තොරතුරු වාර්තා වී තිබේ.

පුරවැසියන් පස් දෙනෙකුගෙන් සිව් දෙනෙකුට මූලික ජීවන මට්ටමක් පවත්වා ගැනීමට පවා අරගල කිරීමට සිදුව ඇති පසුබිමක, කඩදාසි මත පමණක් සීමා වූ සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් පිළිබඳ රජය සිදු කරන උදම් ඇනීම ප්‍රායෝගිකව අර්ථ විරහිත බව අප සාමූහිකය අවධාරණය කර සිටී.

රටේ නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීමෙන් හෝ ආර්ථික අවස්ථා පුළුල් කිරීමෙන් තොරව, ආර්ථික වර්ධනයේ නාමයෙන් අධික වක්‍ර බදු පැනවීම සහ සුබසාධන කප්පාදු කිරීම හරහා පමණක් අයවැය තුලනය කිරීමට උත්සාහ කිරීම අදූරදර්ශී උපායමාර්ගයක් බව දිනන දකුණ සාමූහිකය ප්‍රකාශ කර සිටී.

ජනතාවගෙන් බදු අය කර ගන්නා අතරතුර, සැබෑ ආර්ථික වර්ධනයක් ඇති කිරීමට, ආදායම් උත්පාදන අවස්ථා පුළුල් කිරීමට හෝ දේශීය නිෂ්පාදන අංශවල ඵලදායිතාව ඉහළ නැංවීමට රජය අපොහොසත් වී තිබේ.

ශ්‍රම බලකාය දිළිඳුභාවයට පත් කරමින් සහ රටේ නිෂ්පාදන ධාරිතාව අඩපණ කරමින්, හුදෙක් බදු අය කිරීමෙන් පමණක් ආර්ථිකයක් සමෘද්ධිය කරා ගෙන යා නොහැකි බව අපගේ මතයයි.

පුරවැසියන්ගේ පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ මානව ගරුත්වය බිල්ලට දෙමින් පටු මූල්‍ය ඉලක්ක හඹා යාම පිළිබඳව දිනන දකුණ සාමූහිකය රජයට දැඩි ලෙස අනතුරු අඟවා සිටී.

ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී මානව සුරක්ෂිතභාවය පිළිබඳ පැහැකඩ නොසලකා හැරීමෙන් සමාජ සංහිඳියාව බිඳ වැටීමත්, රාජ්‍ය සේවා අඩාල වීමත්, අවසානයේ රජය අපේක්ෂා කරන ආර්ථික ස්ථාවරත්වයම අහිමි වීමත් නොවැළැක්විය හැකි වනු ඇත.

ඒ අනුව, අප සාමූහිකය රජයට බල කර සිටින්නේ:

1. වැඩවර්ජනයට අවතීර්ණ වී සිටින රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ඉල්ලීම් නොසලකා හරිනු වෙනුවට, ඔවුන් මුහුණ දෙන ක්ෂණික වැටුප් හා ජීවන වියදම් ගැටලුවලට සාධාරණ විසඳුම් ලබා දීමට කටයුතු කරන ලෙසයි.

2. පීඩාකාරී වක්‍ර බදු මත අධික ලෙස රඳා පවතින බදු ක්‍රමය වෙනුවට, සාධාරණ හා ප්‍රගතිශීලී සෘජු බදු ක්‍රමයක් වෙත යොමු වන ලෙසයි.

3. රටේ නිෂ්පාදන අංශ සඳහා සැබෑ ආයෝජන සිදු කරමින් ජනතාවට තිරසාර ජීවනෝපාය අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කරන ලෙසයි.

4. දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ශ්‍රී ලාංකික ජනතාවගේ යහපැවැත්ම මත පදනම් වූ ආර්ථික ප්‍රකෘතියක් ගොඩනැඟීමට කටයුතු කරන ලෙසයි.

5. රටේ ආර්ථික ප්‍රකෘතිය මැනිය යුත්තේ හුදෙක් මූල්‍ය ශේෂ පත්‍ර මත පමණක් නොව, මෙරට කුටුම්භයන්ගේ ආර්ථික සුරක්ෂිතභාවය සහ සමෘද්ධිය මත ද බව පිළිගන්නා ලෙසයි.

රටේ ආර්ථික යුක්තිය සහ මානව ගරුත්වය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව ගෙන යන අරගලය ප්‍රගතිශීලී ක්‍රියාදාමයක් ලෙස දකින දිනන දකුණ සාමූහිකය, එම අරගලය වෙනුවෙන් ස්ථිරසාරව පෙනී සිටින බවත්, වැඩ කරන ජනතාවගේ සාධාරණ ඉල්ලීම් දිනා ගැනීම සඳහා ගෙන යන මෙම අරගලයට සිය සහයෝගය සහ සුබපැතුම් පළ කරන බවත් මෙයින් දන්වා සිටී.

නායකත්ව මණ්ඩලය සහ විධායක කමිටුව
දිනන දකුණ සාමූහිකය